# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2055/59 – 2018 ජනවාරි 26 වැනි සිකුරාදා – 2018.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඩබ්ලිව්ජීඑස්ඩබ්ලිව්ඩී සහ ඊඅයිපී/ ඒසීකිව්/කේබී/09.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/10/2012/එල්ආර්බී/94.

වේරස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2013.05.28 දින ප්‍රසිද්ධ කරන ලද අංක 1812/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2013 අංක 167 දරන 38 (අ) අතුරු විධාන ආඥාව මගින් රජයට පැවරී ඇති මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක 9464 දරන මූලික පිඹුරට ඇතුළත් පහත උපලේඛනයේ විස්තර කර ඇති හිමිකම් ඉදිරිපත් නොවූ ඉඩම් කොටස සඳහා රුපියල් දහසක මුදලක් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වැනි වගන්තිය යටතේ නුගේගොඩ දිසා අධිකරණයේ තැන්පත් කර ඇති බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

උපලේඛන අංක 01

| | | |
|---|---|---|
| 01. පළාත | : | බස්නාහිර |
| 02. දිස්ත්‍රික්කය | : | කොළඹ |
| 03. ප්‍රා.ලේ. කොට්ඨාසය | : | කැස්බෑව |
| 04. ගම | : | බොරලැස්ගමුව |
| 05. ඉඩමේ නම | : | කඳුරුගහ කුඹුර |
| 06. මූලික පිඹුරු අංකය | : | 9464 |
| 07. කැබලි අංකය | : | 169 |
| 08. ප්‍රමාණය | : | කැබලි අංක 169 දරන හෙක්ටයාර් 0.2743ක් වූ ඉඩම් කොටසින් හෙක්ටයාර් 0.1750ක හිමිකම් සනාථ වී නැත |
| 09. නඩු අංකය | : | 2757/17/M |
| 10. තැන්පත් කරන ලද මුදල | : | රු: 1,000.00 (රුපියල් දහසක් පමණි. නාමික අගයකි.) |

ඉහත ඉඩම් කොටසට හිමිකම් කියන අය තම හිමිකම නුගේගොඩ දිසා අධිකරණය වෙත ඉදිරිපත් කර තමන්ට හිමි වන්දි මුදල ලබාගන්නා ලෙස මහජනයාට මෙයින් නිවේදනය කරමි.

සී. ඩබ්ලිව්. අබේසූරිය
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
වේරස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.

02 - 384

1A – G27016 – 14 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*